# 2024 අංක 48 දරන ජාතික අවම වේතනය (සංශෝධන) පනත

2024 අංක 48 දරන සේවකයින්ගේ ජාතික අවම වේතනය සංශෝධන පනත මගින් 2016 අංක 03 දරන ජාතික අවම වේතන පනතේ 3(1) වගන්තියට සිදු කරන ලද සංශෝධනය අනුව යම් කර්මාන්තයක හෝ සේවාවක නියුක්ත සියලුම සේවකයින් සඳහා ගෙවිය යුතු ජාතික අවම මාසික වේතනය රු. 12,500/- සිට රු.17,500/- ක් ලෙසද ජාතික අවම දෛනික වේතනය රු. 500/- සිට රු. 700/- ලෙසද 2024 සැප්තැම්බර් 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇත. මෙම සංශෝධිත පනත 2024 සැප්තැම්බර් මස 13 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ පළකොට ඇත.

එකී සංශෝධිත අවම වේතනයට අමතරව 2005 අංක 36 දරන අයවැය සහන දීමනා පනත යටතේ වන රු. 1,000/- ක ප්‍රමාණයක් සහ 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත යටතේ වන රු. 2,500/- ක ප්‍රමාණයක් ද ගෙවිය යුතු වේ.

| අදාළ පනත | මාසික (රු.) | දෛනික (රු.) |
|---|---|---|
| ජාතික අවම වේතනය (2024 අංක 48 දරන ජාතික අවම වේතනය (සංශෝධන) පනත) | 17,500.00 | 700.00 |
| 2005 අංක 36 දරන අයවැය සහන දීමනා පනත | 1,000.00 | 40.00 |
| 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත | 2,500.00 | 100.00 |
| අනිවාර්ය අවම ගෙවීම | 21,000.00 | 840.00 |

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර**
**කම්කරු කොමසාරිස් ජනරාල්,**
**කම්කරු දෙපාර්තමේන්තුව, "මෙහෙවර පියස" කොළඹ 05.**
**2024.09.19**